# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Sabaragamuwa Provincial Department of Education

අනාවරණ පරීක්ෂණය - 2021
Diaganostic Test

6 ශ්‍රේණිය
Grade 6

බුද්ධ ධර්මය I,II
Buddhism I,II

පැය දෙකයි
Two hours

**නම /විභාග අංකය** ..........................................................................................

❖ පළමු කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

➢ **ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.**

1 සිදුහත් කුමරුට ශිල්ප ඉගැන්වූ ගුරුවරයා
i හග්ගව තවුසා ය. ii සර්වමිත්‍ර බමුණා ය. iii අසිත තාපසතුමාය.

2 සිදුහත් කුමරුගේ නම් තැබීමේ මංගල්‍යයට පැමිණි බමුණු පඬිවරු අතරින් සිදුහත් කුමරු නියත වශයෙන් බුදුවන බව පැවසූ පඬිවරයා වන්නේ
i වප්ප බමුණා ය. ii අස්සජි බමුණා ය. iii කොණ්ඩඤ්ඤ බමුණාය.

3 සිදුහත් කුමරුගේ සත්සුන් බව අගය කරමින් **නිබ්බුත පද** ප්‍රකාශ කළේ ,
i යශෝධරා දේවිය යි. ii කිසාගෝතමී දේවිය යි. iii සුජාතා දේවියයි.

4 බුදු දහමේ මහා බ්‍රහ්මයාගේ තත්ත්වය පිරිනමා ඇත්තේ ,
i දෙමාපියන්ට ය. ii ගුරුවරුන්ට ය. iii හිතමිතුරන්ට ය.

5 ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය ලෙස නම් කර ඇත්තේ ,
i නිල් මහනෙල් මල ය. ii නෙළුම් මල ය. iii සුදු මහනෙල් මල ය.

➢ ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ඇති ප්‍රශ්න නිවැරදි නම් ( √) ලකුණද වැරදි නම් ( x ) ලකුණ ද යොදන්න.

6 ශිෂ්‍යයකු බද්ධ පර්යංකයෙන් භාවනාවට වාඩිවිය යුතුය. ( )

7 විහාරස්ථානයට ගොස් වන්දනා කළයුතු අනුපිළිවෙල වන්නේ බෝධීන් වහන්සේ, වෙහෙර වහන්සේ පිළිම වහන්සේ ලෙස ය. ( )

8 සියලු කෙලෙසුන් නැසීමේ නුවණ ආසවක්ඛය ඥාණය යි. ( )

9 ජාතික කොඩියේ කහ තීරුවෙන් නිරූපණය වන්නේ ජාතීන් අතර එකමුතුව යි. ( )

10 සුද්ධෝදන රජතුමා තම පුතුට දෙවන වැඳීම සිදු කළේ අසිත තවුසාණන් ඉදිරියේ ය. ( )

➢ **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

(පොසොන් , සහම්පතී මහා බ්‍රහ්මයා, ජයමංගල ගාථා ,ත්‍රිකෝටි පාරිශුද්ධ ශීලය, නාගයෙකු, වෙසක් ,ම මුදල් පසුම්බියක් ,නරසීහ ගාථා)

11 යශෝධරා දේවිය රාහුල කුමරුන් හට බුදු සිරුර වර්ණනා කළාය. මෙම වර්ණනා ............................. නමින් හැඳින්වේ.

12 සිදුහත් බෝසතුන්ට මනුලොව උපදින්නට ආරාධනා කළේ ......................................................

13 සෑම සිල්පදයක් ම අංශ තුනකින් ආරක්ෂා කළ යුතුය. එම ශිලය .............................. නමින් හැඳින්වේ.

14 'ආනන්ද සර්පයා දුටුවාද' යනුවෙන් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළේ ............................. දැකීමෙනි.

15 සිදුහත් කුමරු බුද්ධත්වයට පත්ව කිඹුල්වත් පුරයට වැඩම කරන ලද්දේ ............................. පොහෝ දිනයේ ය.

➢ අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට 'අ' කොටසට ගැළපෙන පිළිතුර 'ආ' කොටසින් තෝරා යා කරන්න.

| | (අ) | (ආ) |
|---|---|---|
| 16 | අභියෝග ජයගත්තෙකි | සටීකාර මහා බ්‍රහ්මයා |
| 17 | කිරිපිඬු දානය | සොත්ථිය බමුණා |
| 18 | කුසතණ අට මිට | සුජාතා සිටු දේවිය |
| 19 | සිවුරු පිරිකර | පස්වග තවුසන් |
| 20 | බරණැස ඉසිපතනය | මඝ මානවක කුමරු |

## II - කොටස

❖ පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

01 I සිදුහත් කුමරු දුටු සතර පෙර නිමිති නම් කරන්න.

II රාහුල කුමරුන්ගේ උපත පිළිබඳ පුවත දැනගත් මොහොතේ සිදුහත් කුමරුන්ගේ මුවින් පිට වූ 'රාහුලෝ ජාතෝ බන්ධනං ජාතං' යන පාඨයේ අදහස ලියන්න.

III සිදුහත් බෝසතාණන් වහන්සේ බුද්ධත්වයට පත් වීමත් සමඟ පහළ වූ ඥාණ දෙකක් ලියන්න.

IV බුදු දහමට අනුව නිවන් අවබෝධ කර ගැනීමට අත්හළ යුතු අන්ත දෙක මොනවාද?

V වප් මඟුල් දිනයේ දී සිදුහත් කුමරුන් වඩන ලද භාවනාව කුමක්ද?

VI දුකින් මිදීමේ මඟ සොයා යන සිදුහත් බෝසතුන්ට 'බුදු බව ලබා පළමුව මගේ රාජ්‍යයට වඩින්නැයි' මෙම ඉල්ලීම කළේ කවුද?

VII පංච මහා විලෝකනයන්ගෙන් දෙකක් නම් කරන්න.

VIII යශෝධරා දේවියගේ පියා නම් කරන්න.

IX වචනයෙන් සිදු වන අකුසල් දෙකක් ලියන්න.

X 'යස්සමූලේ නිසින්නෝව- සබ්බාරි විජයං අකා' යන ගාථාව සම්පූර්ණ කරන්න.(ලකුණු 2x10 = 20)

02 I සැපවත් ව ජීවත් වීමටත් සසර දුකින් මිදීමට ත් උපකාර වන බුදුරජාණන් වහන්සේ වදාළ මාර්ගය හඳුන්වන්නේ කුමන නමකින්ද ?(ලකුණු 2)

II ත්‍රිශික්ෂාව නම් කරන්න.(ලකුණු 3)

III සීලය යනු කය, වචනය දෙකෙහි සංවරභාවයයි. සිල්වත් වීමෙන් ලැබෙන ආනිශංස පහක් ලියන්න. (ලකුණු 5)

03 I බුදුරජාණන් වහන්සේ සිගාලෝවාද සූත්‍රය දේශනා කළේ කවුරුන් උදෙසාද?. (ලකුණු 2)

II 'වැල්ලේ පිපෙන බිම්මල වාසනාවන් ' යන කවිය සම්පූර්ණ කරන්න. (ලකුණු 3)

III දරුවන් තම දෙමාපියන්ට උපස්ථාන කළ හැකි ආකාර පහක් ලියන්න. (ලකුණු 5)

04 I වන්දනා කිරීම සඳහා අප පන්සලට යන විට රැගෙන යා යුතු දේවල් දෙකක් ලියන්න. (ලකුණු 2)

II පහත වචන වලට අදාළ ශාසනික වචන ලියන්න. (ලකුණු 3)

1 යනවා 2 වාඩිවෙනවා 3 නිදනවා

III විහාරස්ථානයේ දී අප අනුගමනය කළ යුතු වතාවත් මොනවාද? (ලකුණු 5)

05 I අපේ රටට ආවේණික ජාතික සංකේත දෙකක් නම් කරන්න. (ලකුණු 2)

II ජාතික කොඩියෙහි අඩංගු සංකේත තුනක් ලියා දක්වන්න. (ලකුණු 3)

III ජාතික කොඩිය පරිහරණයේ දී අප සැලකිලිමත් විය යුතු කරුණු පහක් ලියන්න. (ලකුණ 5)

06 I 'තංච කම්මං කතං සාධු - යං කත්වා නානු තප්පති' යන ධම්ම පද ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 2)

II එම ගාථාවේ සරල අදහස ලියා දක්වන්න. (ලකුණු 2)

III ඔබට කළ හැකි යහපත් ක්‍රියා පහක් ලියන්න. (ලකුණු 5)

07 පහත මාතෘකාවලින් දෙකකට කෙටි සටහන් ලියන්න

I සිදුහත් කුමාරයා II අපි පන්සල් යමු

III රාහුල පොඩි හාමුදුරුවෝ IV මෛත්‍රී භාවනාව (02 x 05= 10 )

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Sabaragamuwa Provincial Department of Education**

| | |
|---|---|
| අනාවරණ පරීක්ෂණය - 2021 | 6 ශ්‍රේණිය |
| Diaganostic Test | Grade 6 |

| | | |
|---|---|---|
| බුද්ධ ධර්මය | I,II | පිළිතුරු පත්‍රය |
| Buddhism | I,II | Answer praper |

1 - කොටස

1 iii

2 iii

3 ii

4 ii

5 i

6 √

7 X

8 √

9 √

10 X

11 නරසීහ ගාථා

12 සහම්පතී මහා බ්‍රහ්මයා

13 ත්‍රිකෝටි පාරිශුද්ධි ශීලය

14 මුදල් පසුම්බියක්

15 වෙසක්

16 මඝ මානවක කුමරු

17 සුජාතා සිටු දියණිය

18 සොත්ථිය බමුණා

19 සට්කාර බ්‍රහ්මයා

20 පස්වග තවුසන්

11 - කොටස

01 I මහල්ලෙක් , ලෙඩෙක් , මළමිනියක් , පැවිදි උතුමෙක්

II රාහුලයෙක් උපන්නා ගිහගෙයි බැම්මක් ඇතිවුණා.

III පුබ්බේනිවාසානුස්සතා ඥාණය, චුතුපපාත ඥාණය ,ආසවක්ඛය ඥාණය

IV සිරුරට අධික සැප දීම (කාමසුඛල්ලිකානු යෝගය)
සිරුරට අධික දුක් දීම (අත්තකිලමතානු යෝගය)

V ආනාපාන සති භාවනාව

VI බිම්බිසාර රජතුමා

VII කාලය, දීපය ,දේශය, කුලය, මව

VIII සුප්‍රබුද්ධ රජතුමා

IX බොරු කීම , කේලම් කීම, පරුෂ වචන, කීම හිස් වචන කථා කිරීම

VIII යස්සමූලේ නිසින්නොව-සබ්බාරි විජයං අකා
පත්තෝ සබ්බං යුතං සත්ථා - වන්දේතං බෝධිපාදපං

02 I ආර්ය අෂ්ඨාංගික මාර්ගය (ලකුණු 2)

II ශිල සමාධි ප්‍රඥා (ලකුණු 3)

III මහත් වු භෝග සම්පත් ලැබීම /කීර්තිය පැතිරීම/ පිරිස් මැද නොබියව කටයුතු කිරීමට හැකිවිම/මරණයට බිය නොමැති වීම/ මරණින් මතු සුගතියේ උපත ලැබීම ) (ලකුණු 5)

03 I සිගාල ගෘහපති පුත්‍රයාට (ලකුණු 2)

II වැල්ලේ පිපෙන බිම්මල වාසනාවන්- ගොල්ලේ පිපෙන බිම්මල වාසනාවන්
පෝයදාට පුන්සඳ වාසනාවන්- ජාතිත් අපේ මවුපියෝ වාසනාවන් (ලකුණු 3)

III ආහාර පාන සපයා දීම/අවශ්‍යතා ඉටු කරදීම/පරම්පරාව රැක ගැනීම/ පරපුරෙන් පැවරී ඇති දේපල ආරක්ෂා කිරීම/ දෙමාපියන් මිය ගිය විට පිං පෙත් ලබාදීම (ලකුණු 6

04 I මල් /පහන්/සුවඳ දුම්/ තෙල් /ගිලන් පස (ලකුණු 2)

II යනවා- වඩිනවා
වාඩිවෙනවා- - අසුන් ගන්නවා
නිදනවා- සැතපෙනවා--- (ලකුණු 3)

III පුජා භූමිය පවිත්‍ර කිරීම/ පරමල් හා මකුළුදැල් ඉවත් කර බුදු මැදුර පිරිසිදු කිරීම / මළුපෙත් ඇමදීම/බෝමළුව හා විහාර මළුව ඇමදීම ආදි කරුණුවලට ලකුණු ලබා දෙන්න (ලකුණු 5)

05 I ජාතික කොඩිය/ජාතික ගීය/ජාතික වෘක්ෂ/ ජාතික පුෂ්පය (ලකුණු 2)

II කහපාට සිංහයා /අසිපත/බොපත් සතර/ තද රතුපාට/හා කහපාට තීරුව (ලකුණු 3)

III ජාතික කොඩිය රැගෙන යාමේදී එහි යෂ්ටිය සෘජුව රැගෙන යාම
ක්‍රීඩා උත්සව වලදී හෝ වෙනත් අවස්ථාවලදී හෝ විනෝදය උදෙසා ජාතික කොඩිය පරිහරණය නොකිරීම
කිසිදු අවස්ථාවක එය බිම නොතැබීම
සිංහ රූපයේ පාද පහළට සිටින සේ කොඩිය එසවීම
ජාතික කොඩිය එස වු පසු ජාතීක ගීය ගායනා කිරීම
අවලක්ෂණ හෝ හානියට පත් වු කොඩි භාවිත නොකිරීම(ලකුණු 5)

06 I තංච කම්මං කතං සාධු - යං කත්වා නානු තප්පති
යස්ස පතීතෝ සුමනෝ - විපාකං පටිසේවති (ලකුණු 2)

II යම් ක්‍රියාවක් නිසා පසුතැවිල්ල ඇති නොවේද එහි විපාකය සොම්නසින් විඳිය හැකි වේද එවැනි ක්‍රියා කිරීම හොඳයි (ලකුණු 3)

III ලියා ඇති පිළිතුරකට ලකුණු ලබා දෙන්න. (ලකුණු 5)

07 අදාළ පිළිතුර සලකා බලා ලකුණු ලබා දෙන්න